# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
**MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/13/TR/004/පොදු ව.ලේ. | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2018.03........ |

සමෘද්ධි චක්‍රලේඛ අංක :- **2018/09**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

## <u>මානව සම්පත් සංවර්ධන වැඩසටහන - 2018</u>

### 1. හැඳින්වීම.

වසර 2030 වන විට දුගී බවින් තොර සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. මෙම දැක්ම සැබෑ කර ගැනීම සඳහා මානව සම්පත මානව ප්‍රාග්ධනයක් බවට පත්කළ යුතුව ඇත. එබැවින් 2018 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශයේ ඉලක්කය වනුයේ වාර්ෂිකව පවුල් සවිබල ගන්වා සමෘද්ධිමත් ජාතියක් ගොඩනගා ජාතික ආර්ථිකයට දායක වීමට වෙර දරන නිළධාරින් හා ප්‍රජාව ශ්‍රී ලාංකික මානව ප්‍රාග්ධනයක් බවට පත්කරමින් ඔවුන්ට සේවා තෘප්තියක් ලබා දීමයි. මෙම මානව ප්‍රාග්ධනය ඵලදායිතා කාර්යක්ෂම ගති ලක්ෂණ වලින් හා දැනුම ,කුසලතා හා ධනාත්මක ආකල්ප හා සුසමාදර්ශන්ගෙන් සමන්විත වූ කල්හි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනීමට හැකි මානව ප්‍රාග්ධනයක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළම ජනිත කළ හැකිවේ. මෙවන් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම උදෙසා මානව සම්පත් සංවර්ධන අංශයේ 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. මානව සම්පත් සංවර්ධන අංශයේ සමස්ථ පුහුණුව තුලින් කාර්යමණ්ඩලය සවිබලගැන්වීමත්, එනම් කාර්යමණ්ඩලයේ දැනුම,කුසලතා,හැකියාවන්,ධනාත්මක ආකල්ප,වටිනාකම,මනෝ රාමුව (සිතුවිලි රාමුව) හා සුසමාදර්ශයන් වැඩි දියුණු කිරීමත් අපේක්ෂා කරනු ලබයි.




**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288** |
| | | **Hot Line :0112-889007** | | | |

මේ අනුව 2018 වසර තුළ සමස්ත කාර්යමණ්ඩලය නැවත පුහුණු කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන අතර, ඒ පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

01. දේශීය පුහුණු කිරීම.

| අ.අ. | පුහුණුව | පුහුණු කරන නිලධාරීන් සංඛ්‍යාව | නිමකිරීම ට අපේක්ෂිත දිනය | වැඩි විස්තර සඳහා චක්‍රලේඛයේ ඡේද අංක |
|---|---|---|---|---|
| I.a | ක්‍රමෝපායික සැලසුම්කරණය හා සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන්මග පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | නිලධාරීන් - 250<br>(සිංහල - 200, දෙමළ - 50) | අප්‍රේල් 30 ට පෙර | ඡේද අංක - 2<br>පිටු අංක - 3,4 |
| I.b | **<u>දිස්ත්‍රික් මට්ටම</u>**<br>ක්‍රමෝපායික සැලසුම්කරණය හා සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන්මග පිළිබඳ දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීම | නිලධාරීන් - 200<br>දි.ලේකම්වරුන් - 25<br>දි.අධ්‍යක්ෂවරුන් - 25<br>සම්බන්ධීකරණ නි. - 25<br>දි.කා.කළමනාකරුවන්- 125 | අප්‍රේල් 15ට පෙර | ඡේද අංක - 2<br>පිටු අංක - 3,4 |
| I.c | **<u>ප්‍රාදේශීය මට්ටම</u>**<br>ක්‍රමෝපායික සැලසුම්කරණය හා සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන්මග, ප්‍රා.ලේ.කොට්ඨාශ වල සේවය කරන නිලධාරීන් දැනුවත් කිරීම | 1849<br>ප්‍රා.ලේ.වරුන් - 331<br>මූලස්. කළමනාකරු - 331<br>ප්‍ර.මූ.බැංකු සමිති කළමනාකරුවන් - 331<br>ව්‍යාපෘති කළමනාකරුවන් - 331<br>දි.ලේ.කාර්යමණ්ඩලය - 525 | අප්‍රේල් 30 ට පෙර | ඡේද අංක - 2<br>පිටු අංක - 3,4 |
| I.d | ක්‍රමෝපායික සැලසුම්කරණය හා සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන්මග පිළිබඳ සමෘද්ධි බැංකු වල සේවයකරන සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම | නිලධාරීන් 5370<br>(5×1074) | මැයි 30 ට පෙර | ඡේද අංක - 2<br>පිටු අංක - 3,4 |
| I.e | ක්‍රමෝපායික සැලසුම්කරණය හා සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන්මග පිළිබඳ සමෘද්ධි වසම් වල සේවයකරන සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම | නිලධාරීන් 11500 | ජූනි 30 ට පෙර | ඡේද අංක - 2<br>පිටු අංක - 3,4 |
| II.a | ග්‍රාමීය පවුල් ආර්ථික සවිබල ගැන්වීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම (කළමනාකරුවන්) | නිලධාරීන් - 500<br>(සිංහල 450<br>දෙමළ 50) | ජූනි 30 ට පෙර | ඡේද අංක -4.1<br>පිටු අංක - 5,6 |
| III.a | දිළිඳු පවුල් සවිබලගැන්වීම උදෙසා විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ භූමිකාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | නිලධාරීන් - 500<br>(සිංහල 450<br>දෙමළ 50) | ජූනි 30 ට පෙර | ඡේද අංක 4.2<br>පිටු අංක - 7 |
| III.b | විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ භූමිකාව පිළිබඳ වසම් මට්ටමින් සමෘද්ධි නිලධාරීන් දැනුවත් කිරීම | නිලධාරීන් - 10000 | සැප්තැම්බර් 30 ට පෙර | ඡේද අංක 4.2<br>පිටු අංක - 7 |

| අ.අ. | පුහුණුව | පුහුණු කරන නිලධාරීන් සංඛයාව | නිමකිරීම ට අපේක්ෂිත දිනය | වැඩි විස්තර සඳහා චක්‍රලේඛයේ ජේද අංකය |
|---|---|---|---|---|
| IV.a | ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම | 500<br>(සිංහල 450<br>දෙමළ 50) | ජූනි 30ට පෙර | ජේද අංක -4.3<br><br>පිටු අංක - 7,8 |
| IV.b | <u>ප්‍රාදේශීය මට්ටම</u><br>ව්‍යවසායකත්ව සංවර්ධන පිළිබඳ සමෘද්ධි වසම් වල සේවය කරන සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම | නිලධාරීන් 7500 | සැප්තැම්බර් 30ට පෙර | ජේද අංක -4.3<br><br>පිටු අංක - 7,8 |
| V. | ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව | නිලධාරීන් 395 | සැප්තැම්බර් 30 ට පෙර | ජේද අංක - 3<br><br>පිටු අංක - 4,5 |
| VI. | දිස්ත්‍රික් මට්ටමේ කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම | දිස්ත්‍රික්කයකට 4 බැගින් වැඩසටහන් 100 | සැප්තැම්බර් 30 ටපෙර | ජේද අංක - 3<br><br>පිටු අංක -4,5 |
| VII. | බාහිරස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම | ප්‍ර.කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් හා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරු 25 | අප්‍රේල් 30ට පෙර | ජේද අංක - 5<br>පිටු අංක - 8 |
| VIII. | උපාධි, පශ්චාත් උපාධි, වෘත්තීය පාඨමාලා හැදෑරීම | 50 | ඉල්ලා සිටින දිනයන්ට අදාලවේ. | ජේද අංක - 6<br><br>පිටු අංක - 9 |

2.විදේශීය පුහුණු කිරීම්.

| | | | | |
|---|---|---|---|---|
| IX. | විදේශීය අධ්‍යයන චාරිකා හා පුහුණුව (විශේෂ හැකියාවන් පෙන්වන නිලධාරීන් සඳහා) | නිලධාරීන් - 15 | සැප්තැම්බර් 30 ටපෙර | ජේද අංක - 7<br><br>පිටු අංක - 9 |

## 02. 2018 වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරකම්.

### 2.1. ක්‍රමෝපායික සැලසුම්කරණය හා සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන් මග පිළිබඳ අභ්‍යන්තර කාර්යමණ්ඩලය දැනුවත් කිරීම.

සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම සඳහා නව උපාය මාර්ග පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම මෙම වැඩසටහන පැවැත්වීම අරමුණ වී ඇත. ඒ අනුව සමෘද්ධි වැඩසටහන් දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීමේදී දිස්ත්‍රික් හා ජාතික තලයන්හි , මධ්‍යම ,ඉහළ කළමණාකාරිත්වය විසින් වැඩසටහන් මෙහෙයවීම හා මඟපෙන්වීම හා අධීක්ෂණය පසුවිපරම සිදුකරන බැවින් එම නිළධාරීන්ට උපාය මාර්ගික සැලැස්ම පිළිබඳව ප්‍රථමයෙන් දැනුවත් කිරීම අනිවාර්ය වේ.ඉන්පසුව අනෙකුත් නිළධාරීන්ද දැනුවත් කිරීම සිදු වේ.

මෙම පුහුණු අන්තර්ගතය පහත පරිදිය.

i. සමෘද්ධි සවිබල ගැන්වීමේ නව උපාය මාර්ග පිළිබඳ දැනුවත් කිරීම.
ii. නව සමෘද්ධි පනත පිළිබඳ නිළධාරින් දැනුවත් කිරීම.
iii. 2018 සංවර්ධන සැලැස්ම පිළිබඳව ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා වසම් මට්ටමින් නිළධාරින් දැනුවත් කිරීම සහ එක් එක් නිලධාරියාගේ කාර්යභාරය සහ වගකීම පිළිබඳ දැනුවත් කිරීම.

**2.1.1. ඉහත සඳහන් අන්තර්ගතයට අනුව පැවැත්වෙන මෙම වැඩසටහන පහත සඳහන් පරිදි අදියරයන් කිහිපයක් යටතේ පැවැත්වීමට සැළසුම් කර ඇත.**

2.1.1.i දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරී සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි විෂය භාර කළමනාකරුවන් 5 බැගින් පළමු වැඩසටහන යටතේ දැනුවත් කිරීම.

2.1.1.ii. එක් දිස්ත්‍රික්කයකින් සමෘද්ධි කළමනාකරුවන් 10 කු බැගින් කළමනාකරුවන් 250 කු පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම.

2.1.1.iii. ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය දැනුවත් කිරීම.

2.1.1.iv. ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්යමණ්ඩලය දැනුවත් කිරීම.

2.1.1.v. සමෘද්ධි බැංකු කාර්යමණ්ඩලය දැනුවත් කිරීම.

2.1.1.vi. සමෘද්ධි වසම්හි සේවය කරන ස.ස.නි. දැනුවත් කිරීම.

ඉහත අංක 2.1.1.i සිට 2.1.1.iii දක්වා වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ පුහුණු අංශය මගින් සංවිධානය කර පැවැත්වීමට කටයුතු කරනු ඇත.
ඉහත අංක 2.1.1.ii හි සඳහන් පුහුණුකරුවන් (TOT) ලෙස පුහුණු කරන සංචිතය මගින් අංක 2.1.1.iv , 2.1.1.v , 2.1.1.vi හි සඳහන් පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් සංවිධානය කර ක්‍රියාත්මක කළ යුතුය.

මෙම පුහුණුකරුවන් (TOT) ලෙස පුහුණු කරන සංචිතය සඳහා පුහුනුකරුවන් ලෙස කටයුතු කිරීමේ හැකියාව ඇති සමෘද්ධි කළමනාකරුවන් 10 කු බැගින් තෝරා 2018 මාර්තු 30 දිනට ප්‍රථමව පුහුණු අංශය වෙත එවීමට දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් කටයුතු කල යුතුය.

## 03. ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය සඳහා විෂයානුබද්ධව පුහුණුව ලබා දීම.

අධිකාරින් තුනක එකතුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සැදුම් ලත් බැවින් එම අධිකාරින් තුනේ නිළධාරින් දෙපාර්තමේන්තුවක රාජකාරි කිරීමේදි ආයතනික හා පරිපාලන කටයුතු පිළිබඳව දැනුම කුසලතා හා ධනාත්මක ආකල්පයන් සුසමාදර්ශයන් යාවත්කාලීන කළයුතුව ඇත. දෙපාර්තමේන්තුගත සේවකයින් ලෙස දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව තමා නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

### 3.1. මෙම පුහුණුව පහත විෂය ක්ෂේත්‍රයන්ට අදාලව ලබා දිය යුතුවේ.

i. ආයතනික හා පරිපාලන කටයුතු (ආයතන සංග්‍රහය)
ii. කාර්යාල කළමණාකරණය හා 5S ක්‍රමය
iii. මුදල් රෙගුලාසි(මුදල් සංග්‍රහය)
iv. විමර්ශන කටයුතු
v. විගනන කටයුතු

මෙම වැඩසටහන යටතේ පුහුණු කළ යුතු නිලධාරීන් පිළිබඳ තොරතුරු එක් එක් අංශ ප්‍රධානීන් විසින් මානව සම්පත් සංවර්ධන අංශය වෙත ලබා දිය යුතුය. ඒ ඒ අංශ වල අවශ්‍යතාවය මත මෙම පුහුණු වැඩසටහන් මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලැබේ.

මේ සඳහා පසුගිය වසරේ පරිදි වැය ඇස්තමේන්තුවක් හා පුහුණු අන්තර්ගතය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පුහුණු සැලැස්ම පළමු කාර්තුව තුළ සකස් කර මානව සම්පත් සංවර්ධන අංශය වෙත සැපයිය යුතුවේ. මෙම පුහුණුව වසරේ තෙවන කාර්තුව අවසන් වන විට නිම කිරීම අනිවාර්ය වේ.

### 3.2. දිස්ත්‍රික් මට්ටමින් කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව.

දෙපාර්තමේන්තුගත සේවකයින් ලෙස දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව තමා නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

මේ යටතේ, පරිපාලන හා ආයතන, ගිණුම් හා මූල්‍ය පරිපාලන, විගණන හා විමර්ශණ, ව්‍යවසායකත්ව සංවර්ධන, අලෙවි යන ක්ෂේත්‍ර වලටත්, ක්ෂුද්‍රමූල්‍යකරණය හා සමෘද්ධි බැංකු ගිණුම් ක්‍රියාවලිය, සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීමටත්, සැළසුම් කර ඇත.

මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් / ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන්ට ලබා දිය යුතුයැයි හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව වැඩමුළු සැලසුම් කර, මානව සම්පත් සංවර්ධන අංශයට ඉදිරිපත් කර, දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් ප්‍රතිපාදන නිදහස් කරගත යුතුය.

එලෙසම දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ද, එම අංශයේ අවශ්‍යතා අනුව පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්ෂේත්‍රයේ නිලධාරීන්ට ලබා දීමේදී පෙර පරිදිම මෙම අංශය හරහා සිදුකර ගැනීමට හැකියාව ඇත.

ඉහත පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී, එහි තොරතුරු ඇතුලත් සංක්ෂිප්ත පුහුණු සැලැස්මක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

## 04. සමෘද්ධි වසම් වල රාජකාරී කටයුතු වලට සම්බන්ධ සංවර්ධන නිළධාරින් දැනුවත් කිරීම.

### 4.1. ග්‍රාමීය පවුල් ආර්ථික සවිබල ගැන්වීම සඳහා ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ පුහුණුකරුවන් (TOT) ලෙස කළමණාකරුවන් පුහුණු කිරීම.

දිළිඳු පවුල් සවිබලගැන්වීම සඳහා ප්‍රාදේශිය මට්ටමින් විවිධ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරන අතර එවා සාර්ථක කරගැනීම සඳහා කළමණාකරුවන් සතුව ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ දැනුම,කුසලතාව,ධනාත්මක ආකල්ප හා සුසමාදර්ශයන් පැවතිය යුතුය.

මේ සඳහා ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාවක අඩංගු විය යුතු කරුණු පිළිබඳව කළමණාකරුවන් හා සංවර්ධන නිළධාරින් දැනුවත් කළ යුතුය.ප්‍රජාව ආර්ථික සවිබලගැන්වීම උදෙසා කුඩා ව්‍යාපාර ආරම්භ කරන ප්‍රජාවගේ අධ්‍යාපනික(EDUCATION), රැකියා(EMPLOYMENT), ව්‍යවසායකත්ව (ENTPRENERESHIP), විනෝදාස්වාදය(ENTERTATEMENT) ,කාර්යමණ්ඩල (EMPLOYEE) සමඟ කටයුතු කිරීම පිළිබඳව දැනුම,කුසලතා,ධනාත්මක ආකල්ප,සුමාදර්ශයන් වැඩි දියුණු කිරීමත් අපේක්ෂා කරනු ලැබේ.

මෙම පාඨමාලාවේ අන්තර්ගත කරුණු

- ව්‍යාපෘති කළමණාකරණ මූලධර්ම හා මූලිකාංග
- ව්‍යාපාර කළමණාකරණය හා ව්‍යාපෘති ජීවන චක්‍රය
- ව්‍යාපෘති කළමණාකරණ මෙවලම් සහ ශිල්පීය ක්‍රම
- ආර්ථික සවිබලගැන්වීම සඳහා භාවිතය යටතේ
  - o ව්‍යාපෘති හඳුනාගැනීම
  - o ව්‍යාපෘති සඳහා ගිණුම් සැකසීම
  - o ව්‍යාපෘති සන්නිවේදනය
  - o ව්‍යාපෘති පසුවිපරම් කටයුතු පිළිබඳ දැනුවත් කිරීමට සැලසුම් කර ඇත.

මෙම පාඨමාලාව අවසානයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු හරහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර නිවැරදිව හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමත් එහි නිවැරදි අධික්ෂණය හා පසු විපරම් කටයුතු සිදු කිරීම තුළින් නව කුඩා ව්‍යාපාර ජනිත වීමක් අපේක්ෂා කෙරේ.

දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීමේදි ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ දැනුම,කුසලතාව ලබා දිය යුතු වුවත්, සියළුම සමෘද්ධි නිළධාරින්ට මෙවැනි පුහුණුවක් එකවර කඩිනමින් ලබාදීම අපහසු වේ. එබැවින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පුහුණු කිරිමේ හැකියාව හා කුසලතාව ඇති කළමණාකරුවන් එක් දිස්ත්‍රික්කයකින් 20 දෙනෙකු තෝරාගෙන පුහුණුකරුවන් (TOT) ලෙස 500 දෙනෙකු පුහුණු කිරීම ප්‍රධාන කාර්යාලය මගින් සිදුකරනු ලැබේ.

මේ සඳහා කුසලතා ඇති කළමනාකරුවන් 20 දෙනකු බැගින් 2018 මාර්තු 30 ට පෙර ඇමුණුම **HR/01** අනුව එවීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ වගකීම වේ.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පුහුණු කිරිමේ කුසලතාව ඇති කළමණාකරුවන් තෝරාගෙන පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය මගින් පුහුණු කරනු ලැබේ. මෙහිදි ඔවුන්ට පුහුණු පාඨමාලාවක අඩංගු විය යුතු කරුණු පිළිබඳ දැනුම, කුසලතාව, ධනාත්මක ආකල්ප හා සුසමාදර්ශයන් ලබාදෙනු ලැබේ. ඉතා කෙටි කාලයක් තුළ ප්‍රාදේශිය පුහුණුකරුවන් හරහා සියළුම සමෘද්ධි සංවර්ධන නිළධාරින් හා කළමණාකරුවන්ට ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව ලබා දිය යුතුය.

## 4.2. දිළිඳු පවුල් සවිබලගැන්වීම උදෙසා විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිළධාරින්ගේ භූමිකාව හා පවුල් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරිම.

සමෘද්ධි ව්‍යාපාරයේ දිළිඳු පවුල් සවිබලගැන්වීම උදෙසා සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේද යටතේ සමාජ සජීවිකරණ වැඩසටහන සාර්ථක වීම උදෙසා සංවර්ධන නිළධාරින්,කළමණාකරුවන් හා මෙම වැඩසටහනේ අනෙකුත් නිළධාරින්ද විපර්යකාරකයින් ලෙස කටයුතු කල යුතුය. සජිවීකරණ වැඩසටහන දුර්වල වීමත් සමඟ විපර්යකාරකයේ භූමිකාව (මඟපෙන්වන්නා/ සජීවිකාරක) ප්‍රාදේශිය මට්ටමින් සිදුනොවීම නිසා සමෘද්ධි ප්‍රජාමූල බැංකුව තුළ තැන්පත් කටයුතු, ණයකටයුතු ,පැහැරහැරි ණය ප්‍රමානය හා වෙන් කරන බොල් ණය ප්‍රමාණයද වැඩිවී ඇති අතර, ගණුදෙනුකරුවන්ට සිදුවන මහජන සේවයද දුර්වල වී ඇත. මෙම තත්ත්වයන් නිවැරදි කිරීමට නම් අනිවාර්යයෙන්ම සජීවිකරණ වැඩසටහන ඵලදායි හා කාර්යක්ෂම කිරීමත්, හා විපර්යකාරකයේ භූමිකාව ඵලදායි හා කාර්යක්ෂම කිරීමත් අනිවාර්ය වේ.
එබැවින් 2018 වර්ෂයේ සිට සජීවිකරණ වැඩසටහන සාර්ථක කිරීම උදෙසා විපර්යකාරකයෙකු ලෙස සමෘද්ධි සංවර්ධන නිළධාරින්ගේ භූමිකාව පිළිබඳව පුහුණු අවශ්‍යතාවය දැඩිව දැනී ඇත. සමෘද්ධි ව්‍යාපාරය වූ නෞකාව නිවැරදි දෙසට යාත්‍රා කරවීම උදෙසා මෙම පුහුණු වැඩසටහන සැලසුම් කර ඇත.

### 4.2.1. වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය.

ඉහත පැහැදිලි කර ඇති ආකාරයට එක් දිස්ත්‍රික්කයකින් පුහුණුකරුවන් ලෙස කටයුතු කිරීමේ හැකියාව හා කුසලතාව සහිත කළමණාකරුවන් 20 කු බැගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගෙන පුහුණු කිරීමට සැලසුම් කර ඇත.

මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පලපුරුදු සම්පත්දායක මණ්ඩලයක් යටතේ පුහුණු කිරීම ප්‍රධාන කාර්යාලයේ පුහුණු අංශය මගින් කරනු ලබයි. එබැවින් මෙම පුහුණු වැඩසටහන සඳහා පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමට හැකියාව ඇති සමෘද්ධි කළමණාකාරුවන් **ඇමුණුම HR/01** අනුව 2018 මාර්තු 30 ට පෙර දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් මානව සම්පත් සංවර්ධන අංශයට යැවිය යුතුය.එසේ පුහුණු කරණ ලද පුහුණු කළමනාකරුවන් මගින් ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය පුහුණු කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ වගකීම වේ.

## 4.3. ආර්ථික සවිබලගැන්වීම උදෙසා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු පාඨමාලාව.

සමෘද්ධි බැංකු පද්ධතිය ලාභදායි කිරීම හා එම බැංකු ඵලදායි හා කාර්යක්ෂම කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ අරමුණවේ. සමෘද්ධි බැංකු හරහා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ව්‍යාපෘති ණය ලබා දුන්නද ව්‍යාපෘති අවශ්‍යතා හඳුනා ගැනීමත්, අධීක්ෂණය හා පසු විපරම් කටයුතු වල දුර්වලතාවයන් නිසා අසාර්ථක කුඩා ව්‍යාපාර වැඩි වී ඇති අතර ණය පැහැරහැරීම්ද වැඩි වීඇත. එබැවින් මෙම පාඨමාලාව මගින්මෙම තත්වයන් මඟහරවා ගැනීම අපේක්ෂා කරයි. මෙම පුහුණුවේ අරමුණ සහ පරමාර්ථ,

1. සමෘද්ධි බැංකු හරහා ව්‍යාපෘති ණය ලබාදීම තුළින් ආර්ථික සවිබල ගැන්වීම.
2. පැහැරි හැරි ණය අවම කිරීම.

3. සමෘද්ධි බැංකුව ඵලදායි හා කාර්යක්ෂම කිරීම තුලින් බැංකුවේ ලාභදායිතාවය වැඩි කිරීම.

4. සමෘද්ධිලාභීන් යැපීම් මානසිකත්වයෙන් මුදවා සවිබලගැන්වීම.

4.3.1. ඉහත පැහැදිලි කර ඇති ආකාරයට එක් දිස්ත්‍රික්කයකින් පුහුණුකරුවන් ලෙස කටයුතු කිරීමේ හැකියාව හා කුසලතාව සහිත කළමණාකරුවන් 20 දෙනකු බැගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගෙන පුහුණු කිරීමට සැලසුම් කර ඇත. මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පලපුරුදු සම්පත්දායක මණ්ඩලයක් යටතේ පුහුණු කිරීම ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් කරනු ලබයි. එබැවින් මෙම පුහුණු වැඩසටහන සඳහා පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමට හැකියාව ඇති සමෘද්ධි කළමණාකාරුවන් **ඇමුණුම HR/01** අනුව 2018 මාර්තු 30 ට පෙර තම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් මානව සම්පත් සංවර්ධන අංශයට යැවිය යුතුය. ප්‍රධාන කාර්යාලය මගින් පුහුණු කරනු ලබන පුහුණුකරුවන් මගින් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ වගකීම වේ.

## 05. බාහිරස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම.

මෙතෙක් කාලයක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ බාහිරස්ථ පුහුණු වැඩ සටහන් කෙරෙහි අවධානය යොමුකර නැත. තෝරා ගත් බාහිරස්ථ පුහුණු මධ්‍යස්ථානයක මුල් අදියරේදි මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරින් සඳහා බාහිරස්ථ පුහුණුව ලබා දීම මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම පුහුණුව තුලින් වැඩ පරිසරයේ ආතතියෙන් මිදී වෙනස්ම ආකාරයේ පුහුණු වැඩ සටහනක් පැවැත්වීම අරමුණු කරන අතර මේ තුලින් භාවමය බුද්ධිය අවදි කර කණ්ඩායම් හැගීම් වර්ධනය කර ධනාත්මක චින්තනයක් සහිත කාර්යක්ෂම සේවාවක් සැපයිය හැකි වන පරිදි නිළධාරින්ගේ ආකල්ප වර්ධනය කිරීම මුඛ්‍ය අරමුණ වේ.මෙම පුහුණුවෙහි ත්‍රාසජනක ජල ක්‍රීඩා,සමබල කම්බිය මත ඇවිදීම, උසක සිට රෝදයක ආධාරයෙන් පහලට බැසීම වැනි වෙනස් ආකාරයේ පුහුණු වඩසටහන් වලින් සමන්විත වේ.පුහුණු වැඩසටහන අවසානයේ සුභාවිත සංගීතයේ රසවින්දනය පුළුල් කර සොඳුරු මිනිසුන් බිහිකිරීම මුල් කරගෙන රසවින්දනාත්මක සන්ධ්‍යාවක් සංගීතමය භාවනාවක් කිරීමට අපේක්ෂිතය. මෙම වැඩ සටහන ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කරනු ඇත. තෝරා ගන්නා ලද බාහිරස්ථ පුහුණු මධ්‍යස්ථානයක මෙම පුහුණුව පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

මේ යටතේ

I. අභියෝග වලට මුහුණ දීම.
II. තීරණ ගැනීම.
III. ආකල්ප සංවර්ධනය.
IV. කාර්යඵල සංවර්ධනය.
V. ආතති කළමණාකරණය.
VI. භාවමය බුද්ධිය.

යන මාතෘකා සම්බන්ධව පුහුණුව ලබා දිම අපේක්ෂා කෙරේ.

## 06. උපාධි /පශ්චාත් උපාධි/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.

6.1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා සමෘද්ධි ජාතික සභාව විසින් අනුමත කරන ලද නිර්නායක වලට අනුව දෙපාර්තමේන්තුවේ මූලික අරමුණට හා අදාල තනතුරේ කාර්යයභාරය වඩාත් ඵලදායීව ඉටුකිරීමට ඍජුව දායක වන, බවට දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහිතව අයදුම් කර, අදාල ආයතන විසින් තෝරාගනු ලැබ ඇති අවස්ථාවල අදාල දේශීය හා විදේශීය පාඨමාලා සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු වල රාජ්‍ය නිලධාරීන්ට අදාල වන්නා වූ අනෙකුත් විධිවිධාන වලට යටත්ව පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.

6.2. තවද, මෙම පාඨමාලා පවත්වනු ලබන ස්ථාන රජයේ විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන වෙනත් දේශීය, විදේශීය උසස් අධ්‍යාපන ආයතන විය යුතුය.

6.3. මේ සඳහා ඉල්ලුම් කරනු ලබන නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නිර්දේශ සහිතව ඉදිරිපත් කරනු ඇත.අවශ්‍ය ලේඛන පිටපත් 2කින් ඉදිරිපත් කල යුතුය.

- ඉල්ලුම් පත්‍රය හා ගිවිසුම් පත්‍රය
- විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අංශය මඟින් තෝරාගත් ලිපිය
- ගාස්තු ගෙවූ රිසිට් පත් වල මුල් පිටපත්
- බැංකු ගිණුමේ පාස් පොතේ පිටපත්
- පාඨමාලාව සම්පූර්ණ කර ඇතිනම් සහතික පත්‍රය

මේ සමඟ අමුණා ඇති පාඨමාලාවට ඉල්ලුම් කිරිම සඳහා අවශ්‍ය වන ඉල්ලුම් පත්‍රය **ඇමුණුම /HR/02** මඟින්ද ඒ සඳහා අවශ්‍යවන ගිවිසුම් පත්‍රය **ඇමුණුම /HR/03** මඟින්ද දක්වා ඇත.

## 07. විදේශ ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධීකරණය සහ අත්දැකීම් හුවමාරු අවස්ථා සඳහා නිලධාරින් යොමු කිරීම.

7.1. දුගී ජනතාව සවිබලගැන්වීම සඳහා කලාපීය රටවල් වල ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් වල අත්දැකීම් ලබා දීමේ අරමුණ කෙටි කාලීන විදේශ සංචාර සඳහා අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ වඩා කැපවීමෙන් සහ උනන්දුවෙන් කටයුතු කරන නිලධාරීන් යොමු කිරීම මෙම වැඩසටහන යටතේ සිදුවේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ උපදෙස් අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

7.2. දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරින් වෙත ප්‍රදානය කරනු ලබන විදේශීය ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධයෙන් දිස්ත්‍රික් / ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් දැනුවත් කර සුදුසු නිලධාරින් විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම මානව සම්පත් සංවර්ධන අංශය මගින් සිදු කරනු ලැබේ.

**08.** **පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම.**

8.1.සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීයව පිහිටුවා ඇති පුහුණු මධ්‍යස්ථාන, කාර්ය මණ්ඩල පුහුණුව සඳහා භාවිතා කිරීමට සහ රජයේ සහ පෞද්ගලික අංශ වලට අවශ්‍ය පහසුකම් ලබාදීමත්, එමගින් පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනයට මග පෙන්වා දීමත් අපේක්ෂා කෙරේ.

8.2.නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය 2018 වර්ෂයේදී කුසලතා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කරනු ඇත. එහිදි විවිධ ගායන, වාදන, නර්ථන හැකියාවන් සහිත අඩු ආදායම්ලාභී පුහුණු කර ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් වැඩිදියුණු කර සමාජ ගත කිරීම අරමුණවේ.

8.3. පහත සඳහන් මධ්‍යස්ථාන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මකවේ.

| | |
|---|---|
| බලංගොඩ - සමනලවැව පුහුණු මධ්‍යස්ථානය | - 045 - 3499821 |
| පේරාදෙණිය -නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය | - 081 - 2067215 |
| ත්‍රිකුණාමලය - නිලාවෙලි සමෘද්ධි මධ්‍යස්ථානය | - 026 - 2232335 |

8.4. දිස්ත්‍රික් මට්ටමින් ඉහත මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ස්ථානභාර නිලධාරීන් සමග සාකච්ඡා කර, ඇස්තමේන්තු සකස් කිරීම හා සැලසුම් කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

8.5. එලෙසම, මෙම මධ්‍යස්ථාන පුහුණු කටයුතු සඳහා වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම අපේක්ෂා කරන බැවින් ඔබ දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු වැඩසටහන් මෙම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට ප්‍රචාරණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වනු ඇත.

8.6. එමෙන්ම, ගිණුම් අංශය මගින් නිකුත් කරන ලද, පුහුණු මධ්‍යස්ථාන වල මූල්‍ය හා පරිපාලන උපදෙස් මත මධ්‍යස්ථානයේ පහසුකම් බාහිර පාර්ශව වලට ලබා දීමේ විධිමත් වැඩපිළිවෙලක් අනුව ආදායම් උත්පාදනය කිරීමටත් මධ්‍යස්ථාන භාර නිලධාරින් කටයුතු කළ යුතුය.

8.7. ඉහත පුහුණු මධ්යස්ථාන වල කාර්තුමය ප්‍රගතිය, මධ්යස්ථානභාර නිලධාරීන් විසින් මානව සම්පත් සංවර්ධන අංශයට ත්‍රෛමාසිකව ඉදිරිපත් කළ යුතුය

**09.** **වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන.**

අදාළ වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාත්මක සැලැස්මට අනුව අභ්‍යන්තර කාර්යමණ්ඩල පුහුණුව සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදන වලින් පුහුණු වැඩසටහන් සඳහා මුදල් වැයකරනු ලැබේ. දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් වලට අවශ්‍ය ප්‍රතිපාදන චක්‍ර ලේඛයේ ඇමුණුම් **HR/07** හි සඳහන් පරිදි වෙන්කර ඇත. මීට අමතරව ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් වැය ඇස්තමේන්තු වෙන් වෙන්ව මානව සම්පත් සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

ඒ අනුව දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගන්නා පුහුණු වැඩසටහන් වලට ප්‍රතිපාදන ලබා ගැනීමේ දී අදාල දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් පුහුණු අංශයේ අනුමැතිය ඇතිව දිස්ත්‍රික් කාර්යාල ගිණුමෙන් ප්‍රතිපාදන ලබා ගත යුතුය.

ඊට අමතරව බැංකු කාර්යමණ්ඩලය පුහුණු කිරීම් සිදුකිරීමේදී ඒ සඳහා ප්‍රතිපාදන වැය කිරීම බැංකු මූල්‍ය අධ්‍යක්ෂකගේ නිර්දේශය මත, එම අංශයේ අරමුදල් මගින් සිදුකරනු ලැබේ. එමෙන්ම, දෙපාර්තමේන්තමේන්තුවේ අනෙකුත් අංශ මගින් ද හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු පුහුණු වැඩසටහන් සඳහා එම අංශවල ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ ප්‍රතිපාදන නොමැති අවස්ථාවල අත්‍යවශ්‍ය පුහුණු සඳහා අදාල ඇස්තමේන්තු මානව සම්පත් සංවර්ධන අංශය වෙත ඉහත ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

### 9.1. ප්‍රාදේශිය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමට මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම

චක්‍ර ලේඛනයේ වසම් භාර සංවර්ධන නිළධාරීන් පුහුණු කිරීමට අදාළව පුහුණුකරුවන් පුහුණු කරන නිළධාරීන් ලවා ප්‍රාදේශිය මට්ටමේ සියලුම කළමණාකරුවන් හා සංවර්ධන නිළධාරීන් දැනුවත් කළ යුතුවේ. ඒ සඳහා මානව සම්පත් සංවර්ධන අංශය විසින් දිස්ත්‍රික් මට්ටමින් ඇමුණුම් HR/08 හි සඳහන් පරිදි මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙනු ඇත.

## 10. ප්‍රගති සමාලෝචනය.

10.1 මානව සම්පත් සංවර්ධන අංශයට අදාල කාර්යයන් පිළිබඳව ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම ඉතා වැදගත් කාර්යයක් වන බැවින් එම කාර්යය පහත සඳහන් පරිදි සංවිධානය කළ යුතුය.

| ප්‍රගති සමාලෝචන මට්ටම | යෝජිත කාල පරාසය | මෙහෙයුම් වගකීම |
|---|---|---|
| ප්‍රාදේශීය මට්ටම | මසකට වරක් - සමාන්‍ය ප්‍රගති සමාලෝචනයේ එක් විෂයක් ලෙස | මූලස්ථාන කලමණාකරු |
| දිස්ත්‍රික් මට්ටම | දෙමසකට වරක් - | දිස්ත්‍රික් පුහුණු කලමණාකරු |
| පුහුණු මධ්‍යස්ථාන මට්ටම | මසකට වරක් | ස්ථාන භාර නිලධාරී |
| ජාතික මට්ටම | තෙමසකට වරක් | අධ්‍යක්ෂ මානව සම්පත්(මානව සම්පත් සංවර්ධන අංශය) |

10.2 පුහුණු මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් වල මාසික ප්‍රගතියත්, පුහුණු මධ්‍යස්ථානවල කුඩා ව්‍යාපෘති මගින් ලැබෙන ආදායම් ප්‍රගතියත් ඇමුණුම **HR/04** හා ඇමුණුම **HR/05** අනුව සකස් කර, සෑම මසකම 10 වන දිනට පෙර මානව සම්පත් සංවර්ධන අංශයට ලබා දීමට කටයුතු කල යුතුවේ.

10.3 මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යයන් දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සඳහා කළමනාකරුවකු අනුයුක්ත කළ යුතු අතර, එමගින් මෙම කාර්යය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකර ගත හැකිවනු ඇත.

10.4 මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික්කයට ලැබීමෙන් අනතුරුව එහි ප්‍රගතිය **ඇමුණුම HR/06** අනුවත් , මූල්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය මට්ටමට ලැබීමෙන් අනතුරුව එහි ප්‍රගතිය **ඇමුණුම HR/07** අනුව දිස්ත්‍රික්කයට පිටපත් සහිතව ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශයට එවිය යුතුය.

10.5 ඊට අමතරව පුහුණු වැඩසටහන සිදුකල ආකාරය පිළිබඳව වාර්තාවක් හා අදාළ ඡායාරූප ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරු විසින් මානව සම්පත් සංවර්ධන අංශයටද පිටපත් සහිතව දිස්ත්‍රික් පුහුණු කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

## 11. අධීක්ෂණය හා පසු විපරම් කටයුතු.

11.1 මානව සම්පත් සංවර්ධන අංශයේ සිදුකරනු ලබන සෑම පුහුණු වැඩසටහනකම දිස්ත්‍රික් අධීක්ෂණය, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ වගකීම වේ. පසු විපරම් කටයුතු මානව සම්පත් විෂය භාර කළමණාකරු විසින් නිරන්තරයෙන් සිදුකල යුතුය. දිස්ත්‍රික්කයට මූල්‍ය ප්‍රතිපාදන ලද විගස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ප්‍රතිපාදන නිදහස් කළ යුතුය. දෙවන, තෙවන කාර්තුවට පෙර වැඩසටහන් සිදුවන්නේද යන්න පසු විපරම් කළ යුතුය.

11.2 2018 වර්ෂයේ ඔක්තෝම්බර් වන විට සියළු පුහුණු වැඩසටහන් අවසන් විය යුතු අතර, දිස්ත්‍රික්කයේ අමතර මුදල් ඉතිරිව තිබේනම් ඔක්තොම්බර් 30ට පෙර අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන වෙත ඉදිරිපත් කළ යුතුය.

11.3 දෙපාර්තමේන්තුවේ විශාල මුදලක් පුහුණු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් 2018 වර්ෂයේ ප්‍රතිපාදන වෙන්වන බැවින්, දිස්ත්‍රික් විගණන නිළධාරින් විසින් මාස 3කට වරක් දිස්ත්‍රික්කයට / ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර ඇති ප්‍රතිපාදන ලැබුනු පසු එය විගණනය කර වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාවේ, දෙපාර්තමේන්තුවේ ඉහළ,මධ්‍යම,පහළ, කළමණාකාරිත්වය පුහුණු කිරීම සඳහා ප්‍රතිපාදන වැයකර ඇති ආකාරයත්, එහි භෞතික ප්‍රගතියත් චක්‍රලේඛනයට අනුව කටයුතු කර තිබේද යන්න පිළිබඳවත්, ප්‍රාදේශීය මට්ටමේ සිදුකර ඇති පුහුණු වැඩසටහන්හී සිදුව ඇති අඩුපාඩු පිළිබඳවත් සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

## 12.පොදු උපදෙස්.

12.1. මානව සම්පත් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා වන වියදම් ඇස්තමේන්තු දෙපාර්තමේන්තුවේ මුදල් අංශය විසින් නිකුත් කරණු ලබන මූල්‍ය උපදෙස් වලට අනුකූල විය යුතුය.

12.2 පුහුණු හා පාඨමාලා හැදෑරීම පිළිබඳව අදාල රාජ්‍ය පරිපාලන නීතිරීති හා ආයතන සංග්‍රහය ආදී වූ රාජ්‍ය දෙපාර්තමේන්තුවක සේවකයන්ට බලපාන නීති රෙගුලාසි අදාල වන්නේය.

12.3 දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගත් පුහුණු පාඨමාලා හැකි සෑම අවස්ථාවකදීම මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වීමට කටයුතු කළ යුතු අතර වැඩසටහන් සංවිධානය කිරීමේ දී එම මධ්‍යස්ථාන සමග නිසි සම්බන්ධීකරණයක් සහිත සැලසුම් කළ යුතු වේ.

12.4 පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් යොදා ගැනීමේ දී මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර, ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට අදාල ඒ ඒ සංචිතයේ පුහුණුකරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

12.5 එක් එක් විෂය ක්ෂේත්‍රය පිළබඳව විශේෂඥ දැනුමක් සහිත සම්පත්දායකයින් අවශ්‍ය වන අවස්ථාලවලදී දෙපාර්තමේන්තුවෙහි අදාල සුදුසුකම් සපුරා ඇති සම්පත්දායකයින් නොමැති නම් එම විෂය ක්ෂේත්‍ර සඳහා බාහිර විශේෂඥ සම්පත්දායකයින් යොදවා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

12.6 විශේෂඥ සම්පත්දායකයන් හා දෙපාර්තමේන්තු සම්පත්දායකයන් අදාල කාර්යයන් සඳහා යොදවා ගැනීම පහසුවීම පිණිස ඔවුන්ගේ පුහුණු සුදුසුකම් ද ඇතුලත් යාවත්කාලීන දත්ත පද්ධතියක් මානව සම්පත් සංවර්ධන අංශයට අමතරව, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද පවත්වාගෙන යා යුතුය.

12.7 හඳුනා ගන්නා ලද විශේෂ පුහුණු වැඩසටහන් උදා. SLIDA, IBSL, IPM, MILODA, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන හෝ පෞද්ගලික ආයතන වලට යොමු කර ජාතික මට්ටමින් පුහුණුවීම් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත. ඒ සඳහා දිස්ත්‍රික් මට්ටමින් පුහුණුව ලබා දිය යුතු නිලධාරින් හඳුනාගෙන මානව සම්පත් සංවර්ධන අංශයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**පිටපත්:**

1. **සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ ගරු අමාත්‍ය එස්.බී.දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.පි**
2. **ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ - කා.දැ.ගැ.ස**
3. **විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**
4. **ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**
5. **ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස**
6. **සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ**